සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**10 ශ්‍රේණිය** | **වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024)** | **40 S I**

නම: ..............................................

# පෙරදිග සංගීතය

**කාලය පැය එකයි**

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වලදී 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01) රාගයක නොයෙදෙන එහෙත් රස වර්ධනය සඳහා රාගයක කලාතුරකින් යොදාගන්නා ස්වර හඳුන්වන්නේ කුමන නමකින්ද ?

I. වාදී II. සංවාදී III. අනුවාදී IV. විවාදී

02) ම,නි, ස්වර වර්ජිත වන නිර්දේශිත රාගය කුමක්ද?

I. බිලාවල් II. භූපාලි III. කාෆි IV. යමන්

03) භෛරවි රාගයේ අනුවාදී ස්වර සඳහන් පිළිතුර කුමක්ද?

I. රි ග ධ නි II. රි ග ම' ධ නි III. රි ග ප ධ නි IV. රි ග ප ධ නි

04) නිර්දේශිත රාග අතුරින් රාත්‍රි ප්‍රථම ප්‍රහරයේ ගැයෙන වැයෙන සම්පූර්ණ ජාති රාගය කුමක්ද?

I. යමන් II. භූපාලි III. කාෆි IV. බිලාවල්

05) භෛරවී රාගය ගායනයේදී හා වාදනයේදී යොදාගත හැකි විවාදී ස්වර,

I. හතරකි. II. පහකි. III. හයකි. IV. හතකි.

06) යමන් සහ භෛරවී රාග යන දෙක පිලිබඳ නිවැරදි කරුණු සඳහන් වී ඇති පිළිතුර කුමක්ද?

I. රාග දෙකම ජාතිය සම්පූර්ණය. II. තීව්‍ර,මධ්‍යය,විවාදී ලෙස යොදාගැනේ.
III. වාදී ස්වර සමානය. IV. ප්‍රකෘති විකෘති ස්වර දොළහ ම යෙදේ.

07) භෛරවී හා කාෆී යන රාග දෙක පිලිබඳව ලියවී ඇති වැරදි ප්‍රකාශය කුමක්ද?

I. ජාතිය සම්පූර්ණවේ. II. සංවාදී ස්වර සමාන වේ. III. විවාදී ස්වර යෙදේ. IV. සියලුම ස්වර කෝමළ වේ.

08) | ධ ම ධ නි | ස- රි ස | යන ස්වර කාණ්ඩය යොදාගැනෙන රාගයේ ගායනසමය කුමක්ද?

I. දිවා ප්‍රථම ප්‍රහරයයි. II. රාත්‍රී ප්‍රථම ප්‍රහරයයි. III. රාත්‍රී දෙවන ප්‍රහරයයි. IV. දිවා දෙවන ප්‍රහරයයි.

09) කළ්‍යාණ මේලගත රාග යුගලය තෝරන්න.

I. බිලාවල් - යමන් II. යමන් - භූපාලි III. කාෆී - බිලාවල් IV. භෛරවී - බිලාවල්

10) | නිරි ගරි ස -++ | නිධ නිරි ස - ++ | මෙම තානාලංකාරය වඩාත් ගැළපෙන රාගය කුමක්ද?

I. බිලාවල් II. භූපාලි III. භෛරවී IV. යමන්

11) 3:4 අනුපාතයට අනුව ස්වර සංඛ්‍යාතය සොයනු ලබන්නේ,

I. මධ්‍යමයේය. II. පංචමයේය. III. ධෛවතයේය. IV. නිශාදයේය.

12) එක් තත්ත්පරයක් තුළදී සිදුවන කම්පන වාරගණන හඳුන්වන්නේ,

I. සම්පිණ්ඩනය නමිනි. II. විරලනය නමිනි. III. සංඛ්‍යාතය නමිනි. IV. නාද තරංග නමිනි.

13) පෙරදිග සංගීතයේදී රූප භේදය, උච්ච නීච භේදය, ජාති භේදය ලෙස හඳුන්වනු ලබන නාදයේ ත්‍රිවිධ ගුණ විද්‍යා විෂයේදී හඳුන්වන නිවැරදි පිළිවෙල කුමක්ද?

I. ධ්වනි ගුණය,තාරතාවය,විපුලතාවය II. විපුලතාවය, තාරතාවය,ධ්වනි ගුණය
III. තාරතාවය,විපුලතාවය,ධ්වනි ගුණය IV. තාරතාවය,ධ්වනි ගුණය,විපුලතාවය

14) ස්වර සංඛ්‍යාතය 426Hz වන ස්වරය මින් කුමක්ද?

I. ම II. ප III. ධ IV. නි

15) ශ්‍රී ලංකා ගුවන් විදුලියේ ආරම්භක වර්ෂය ලෙස සැලකෙන්නේ මින් කුමක්ද?

I. 1905 II. 1925 III. 1935 IV. 1952

16)''බැස සීතල ගඟුලේ පීන පීන'' යන ගීතය හා '' වරෙන් හීන් සැරේ '' යන ගීත ගායනා කළ ශිල්පීන් දෙදෙනා වන්නේ,

I. සුනිල් ශාන්ත මහතා හා අමරදේව මහතා වේ.
II. අමරදේව මහතා හා ආනන්ද සමරකෝන් මහතා වේ.
III. ආනන්ද සමරකෝන් මහතා හා සුනිල් සාන්ත මහතා වේ.
IV. ආනන්ද සමරකෝන් මහතා සහ අමරදේව මහතා වේ.

17) '' බෙයිජි බවුරා'' චිත්‍ර පටයේ ''එන තු ගංගාකී මෞජු මෙ'' යන ගීතය නිර්මාණයේදී ආශ්‍රය කරගත් රාගය මින් කුමක්ද?

I. යමන් II. බිලාවල් III. කාෆි IV. භෛරවි

18) ජප් තාලයේ මාත්‍රා බෙදීමට සමාන බටහිර සංගීත පද්ධතියේ භාවිතාවන තාල සංකේතය තෝරන්න.

I. 3/4 II. 2/4 III. 5/4 IV. 7/4

19) මනමේ නාට්‍යයේ එන '' රුසිරු ලඳුනි ඔබ ප්‍රේමයේ නා'' ගීතයට පදනම් වූ පැරණි නාඩගම් තනුව ඇති ගීතය කුමක්ද?

I. ලෝ පසිදු රුසිරියෙන් සිරිදු II. මෙමගින් ගිය රුසිරු එ තරුණා
III. යානත අතුල මල්පෙති IV. දුල් නිමල් සිසිසේ දිසි

20) පරිගණකය ආධාරයෙන් සංගීතය පටිගත කිරීමට යොදාගන්නා මෘදුකාංගය වන්නේ,

I. ADOBE AUDIOTION II. CALK WORK III. CUBASE IV. NUENDO

21) පණ්ඩිත් රවි ශංකර්, ශකීර් හුසේන් සහ පණ්ඩිත් හරී ප්‍රසාද් චෞරසියා, යන සංගීතඥයින් වාදනයෙහි ප්‍රකට වූ සංගීත භාණ්ඩ පිළිවෙලින් සඳහන් වූ පිළිතුර කුමක්ද?

I. සිතාර්,බටනලා,තබ්ලා II. තබ්ලා,බටනලා, සිතාර් III. බටනලා,සිතාර්,තබ්ලා V. සිතාර්,තබ්ලා,බටනලා

22) අනාඝාතාත්මකව ගැයෙන මෙහෙ ගී පාදය තෝරන්න.

I. බුද්ධං සරණේ සිරස දරාගෙන II. පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
III. කන්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා. IV. උදයට පායන හිරු දෙවියන්ටයි.

23) මච්ගුණ ගැයෙන ග්‍රැමෆෝන් ගීතයක් වන්නේ මින් කුමන ගීතයද?

I. දැඩිකල මාතා පෙම්බර මාතා II. සසර වසන තුරු
III. සොම්නස හෝ සන්තාපය හමුවේ. IV. ඕලු නෙලුම් නෙරිය රගාලා

24) ''ප්‍රේමයෙන් මන රංජිත වේ නන්දිත වේ,'' ''ආලේ බැන්ද මාගේ රම්‍ය වන්,'' ''ගල්ලෙන බිඳලා ලෙන්දොර හැරලා'' යන ගීත ඇතුළත් නාට්‍ය, පිලිවෙලින් සඳහන් පිළිතුර කුමක්ද?

I. මනමේ,සිංහබාහු,දික්තල කාලගෝල II. දික්තල කාලගෝල,සිංහබාහු, මනමේ
III. සිංහබාහු, මනමේ, දික්තල කාලගෝල IV. මනමේ, දික්තල කාලගෝල, සිංහබාහු

25) පහත සඳහන් ගීත අතරින් සේ ගීයක් නොවන්නේ කුමක්ද?

I. වරමතී සුබ චරිතේ II. සඳවා සුදුවැලි පිවිතුරු
III. ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට IV. මෝරා බීජයෙනා

• 26 සිට 30 දක්වා ප්‍රශ්න වලට පහත දී ඇති බටහිර ස්වර ප්‍රස්තාරය උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.



26) ඉහත බටහිර සංගීත ප්‍රස්තාරය ට අදාල ස්කේලය (Scale) කුමක්ද?

I. (C) II. (F) III. (G) IV. ($B^b$)

27) මෙම බටහිර සංගීත ප්‍රස්තාරයට යෙදිය යුතු (Time Signature) ටයිම් සිග්නේචර් එක වන්නේ,

I. 3/4 II. 2/4 III. 4/4 IV. 5 /4

28) ප්‍රස්තාරයේ සඳහන් නිහඬ මාත්‍රාව හඳුන්වන නම කුමක්ද?

I. Semibreve Rest II. Minim Rest III. Crotchet Rest IV. Quaver Rest

29) හතරවන හා පස්වන විභාග වල ඇතුලත් ස්වර නිවැරදි ව ලියා ඇති පිළිතුර කුමක්ද?

I. | රි ස නි | නි - ස | II. | රිස නි | නි - ස | III. | රි ස නි | නි - ස | IV. | රිසනි | - - ස |

30) ප්‍රස්තාරයේ අවසාන විභාගයේ ඇති සංකේත යේ වටිනාකම,

I. එකකි. II. දෙකකි. III. තුනකි. IV. හතරකි.

31) සිතාරය හා එස්රාජය යන සංගීත භාණ්ඩ දෙකේම දක්නට හැකි සමාන ලක්ෂණයක් නොවන්නේ,

I. ප්‍රධාන තත මන්ද්‍ර මධ්‍යයට සුසර කිරීමය.
II. පර්දා පුවරුවක් මත ස්වර පිහිටීමය.
III. මිස්ශ්‍රාබයෙන් වාදනය කිරීමය.
IV. කෝමළ, රිෂභය හා ධෛවතය සඳහා පාර්දා පිහිටා නොතිබීමය.

32) අවග්‍රහයෙන් ගැයෙන සරල ගී පාදය ඇතුලත් පිළිතුර තෝරන්න.

I. අම්මා සඳකි මම ඒලොව හිරුය රිදී
II. මේ තරම් සියුමැලිද කළුගල් සිතන්නටවත් බැරි නිසා
III. ගුමුගුමුව වදුලේ සිලි සිලිය සුළගේ
IV. නිල් අහස්තලේ අගේ නෑ වලාකුළු

33) ගොයම් දා මගුල, මාර පරාජය, ගිහිගෙයින් මරුමුවට, සහ මහාභිණිෂ්ක්‍රමණය යන නිර්මාණයන් සිදුකරන ලද ශ්‍රී ලාංකීය සංගීතඥයා කවුරුන්ද?

I. ප්‍රේමසිරි කේමදාස මහතා
II. ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා
III. සී.ද.එස්. කුලතිලක මහතා
IV. ලයනල් රන්වල මහතා

34) ''රුං පෙත්ත කැරකෙනවා කෝම්පිට්ටු ඉදිවෙනවා'' යන මෙම ගීත පදයේ ඇතුළත් ලඝු, ගුරු සහ ප්ලුත අක්ෂර ගණන නිවැරදිව පිලිවෙලින් සඳහන් පිළිතුර කුමක්ද?

I. 22,4,4 II. 10,4,2 III. 16,10,4 IV. 5,2,1

35) පහත දී ඇති තබ්ලා අක්ෂර ප්‍රබන්ධ අතුරින් කායදා ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

I. | ධාධා ති ට | ධා ධා තු නා
II. | ධාධා ධති ටධා | ධාධා තිට ධාධා තනා
III. | තිට ධති ටධ තිට | ධාධා තිට ධාධා තුනා
IV. | ධාධා ධාධා තිට | ධාධා තිට ධාධා තුනා |

36) පහළම ස්වරය ලෙස මන්ද්‍ර ගාන්ධාරයට සුසර කරන සංගීත භාණ්ඩය මින් කුමක්ද?

I. ගිටාරය II. එස්රාජය III. සිතාරය IV. මැන්ඩලීනය

37) ස්වර පුවරු භාණ්ඩ අතරින් වැඩිම ස්වර සප්තක ප්‍රමාණයක් ඇති භාණ්ඩය කුමක්ද?

I. එකෝර්ඩියනය II. සර්පිනාව III. මොලෝඩිකාව IV. පියානෝව

38) ශාස්ත්‍රීය ගායන වාදන වලදී ශ්‍රැතිය පවත්වාගැනීමට යොදාගත හැකි වඩාත් උචිත වාද්‍ය භාණ්ඩය කුමක්ද?

I. සර්පිනාව II. තබ්ලාව III. තාම්පුරාව IV. සිතාරය

39) උපකරණයක් භාවිතා නොකර වාදනය කරන වාද්‍ය භාණ්ඩය කුමක්ද?

I. තාම්පුරාව II. ගිටාරය III. සිතාරය IV. මැන්ඩලීනය

40) එකම ස්වරයකට තත්දෙක බැගින් සුසර කරන තත් අටකින් යුත් වාද්‍ය භාණ්ඩය තෝරන්න.

I. එස්රාජය II. සිතාරය III. තාම්පුරාව IV. ඉංග්‍රීසි මැන්ඩලීනය

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 40 S II

නම: ............................................ | පෙරදිග සංගීතය | කාලය පැය දෙකයි

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමිවේ.

- අංක 01 සිට 04 දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුර ලියන්න.

01) I. ස්වර 5ක් විවාදි ස්වර ලෙස යොදාගන්නා නිර්දේශිත රාගය නම් කරන්න.
II. එක් විකෘති ස්වරයක් පමණක් යෙදෙන නිර්දේශිත රාගය නම් කරන්න.
III. ශාස්ත්‍රිය සංගීතයේදී ස්වර වලින් පමණක් නිර්මාණය වූ ගීත විශේෂය කුමක්ද?
IV. රාගයක ඇති ප්‍රධාන ස්වර සංගතිය හඳුන්වා ඇත්තේ කුමන නමින්ද?

- අංක v සිට vii තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.

V. විද්‍යුත් මාධ්‍යය මගින් කරනු ලබන ඉගෙනුම ...................................................................... නමින් හඳුන්වයි.
VI. සංගීතමය නාද විද්‍යුත් අංකිත ක්‍රමයකට හුවමාරු කිරීමේ ක්‍රමය................................................ නමින් ඉංග්‍රීසි කෙටි යෙදුමෙන් හඳුන්වයි.
VII. අන්තර්ජාලයේ ඇති විශාලතම වීඩියෝ එකතුව ඇති වෙබ් අඩවිය.................................................... වේ.
VIII. ගීතයක අර්ථය තිව්‍ර කිරීමෙහිලා තනුව සමග ඊට සමාන්තරව කරනු ලබන වාද්‍ය කණ්ඩය.............................................නමින් හඳුන්වයි.

- අංක IX සහ X ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුරු පහත වරහන් තුළින් තෝරා ලියන්න.
(Introduction, Interlude, Bits, Chorus, Verse, Chords)

IX. ස්වර ප්‍රස්තාරයක ස්ථායි හා අන්තරා හඳුන්වන්නේ කෙසේද? .......... .......... (ලකුණු 02)
X. ආරම්භයක වාදනය හා අතුරු වාදනය හඳුන්වන්නේ කෙසේද? .......... .......... (ලකුණු 02)
(මුළු ලකුණු 12)

- පහත ABCD අක්ෂරවලින් සඳහන් කර ඇත්තේ නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගති 4කි.

02) A - ගරි, ගප, මග , මරිස  B - ධ̣,නි̣,ස රි̲ ස, මග̲, සරි̲ස
C - ගරි, ගපධප, ගරිස  D - නි̣රිගම', ප - රි ස

I. A,B,C,D. ස්වර සංගති අයත් රාග ඉංග්‍රිසි අක්ෂරය ද සමග ලියා දක්වන්න. (ලකුණු 02)
II. B හෝ D රාගයට අයත් මධ්‍යලය ගීතයක / වාදිතයක ස්ථායි කොටස නිවැරදි තාල සංඥා සහිතව ස්වර ප්‍රස්තාර කර රාගය නම් කරන්න. (ලකුණු 06)
III. පහත සඳහන් රාගාශ්‍රිත සරල ගීත නිර්මාණයේදී ආශ්‍රය කර ගත් නිර්දේශිත රාගවල නම් ඉංග්‍රිසි අක්ෂරයද සමග ලියන්න. (ලකුණු 04)
a) පාරමිතා බල පූරිත පූජිත  b) සාදු දන්තදා
c) ගුමු ගුමුව වදුලේ  d) සවන්දි පෙර රාම චරිතේ අසව් (මුළු ලකුණු 12)

03) පහත දැක්වෙන්නේ නිර්දේශිත තාල කීපයක තොරතුරු ය. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
a) මාත්‍රා 10කින් යුතු තාලයකි. එහි ඛාලි ස්ථානය 6 වන මාත්‍රාව මත පිහිටයි.
b) දේශීය සංගීතයේ මැඳුම් මහ දෙතිතට සමාන හින්දුස්ථානි තාලයකි.
c) සෑම විභාගයකම මාත්‍රා ගණන සමාන වන ඛලි ස්ථානය 9 වන මාත්‍රාවේ පිහිටන තාලයකි.
d) විභාග දෙකක් සහිත මාත්‍රා 06කින් යුත් හින්දුස්ථානි තාලයකි.
I) a, b,c d අක්ෂර වලින් හැඳින්වෙන තාල හතර අදාළ ඉංග්‍රිසි අක්ෂරය සමග නම් කරන්න. (ලකුණු02)
II)a හා c තාල දෙකට සමාන බටහිර තාල සංකේත දෙක ලියා දක්වන්න. (ලකුණු 02)
III) ඉහත b අක්ෂරයෙන් හැඳින්වෙන තාල පදය නිවැරදිව ප්‍රස්තාර කරන්න. (ල. 04)

IV) d අක්ෂරයෙන් හැඳින්වෙන ශ්‍රේඨාව හා ඊට සමාන බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කරන්න. (ල.4)
(මුළු ලකුණු 12)

04) i. පහත සඳහන් සංගීතඥයින් අතරින් එක් අයෙකු තෝරාගෙන ඔහුගෙන් ශ්‍රී ලාංකීය සංගීතයට සිදු වූ සේවය පිළිබඳව උදාහරණ සහිතව විස්තරයක් කරන්න. (ල.6)
a) ඩබ්ලිව් බී. මකුලොලුව මහතා
b) සී ද එස් කුලතිලක මහතා
c) ආනන්ද සමරකෝන් මහතා

ii. ග්‍රැමෆෝන් තැටි යුගයට අයත් මූලික යුග තුන නම් කරන්න. (ල.3)
iii. ග්‍රැමෆෝන් ගීතයක හෝ මුල්යුගයේ ගුවන්විදුලි සරල ගීතයක මුල් කොටස ලියාදක්වන්න. (ල.3)
(මුළු ලකුණු 12)

05) පහත දැක්වෙන්නේ දේශීය ජන ගී කිහිපයක මුල් පාද පේලිවේ. (මුළු ලකුණු 12)
A. රළලා උපුලා ලෙලුම තුලායා
B. මනමත් කරවන දන මුළු දෙරණා
C. අතට වෙරළු ඇහිද ගෙනේ
D. රූ රැසේ අදිනා ලෙසේ
E. බුද්ධං සරණේ සිරස දරාගෙන
F. උදයට පායන හිරු දෙවියන්ටයි.


i. ඉහත සඳහන් ගී පද ගැමි ගී හා සේගී වශයෙන් වෙන්කර ඉංග්‍රීසි අක්ෂරය සමග ලියන්න. (ල.3)
ii. A හා B අක්ෂර වලින් හඳුන්වා ඇති ගීත ගායනයේදී අසාතය තබන ආකාරය නම් කරන්න. (ල.2)
iii. E හි සඳහන් ගී පාදය ගැයීමට සුදුසු තාලය අනුව පද ප්‍රස්තාර කරන්න. (ල.4)
iv. ගැමි ගී නිර්මාණය සඳහා පදනම් වූ කරුණු 03 නම්කරන්න. (ල.3)
(මුළු ලකුණු 12)

- පහත ඉංග්‍රීසි අක්ෂර වලින් දක්වා ඇත්තේ නාට්‍ය සම්ප්‍රදායන් තුනකට අයත් තොරතුරු කිහිපයකි.

06) A. වෙස් මුහුණු පළඳියි, පහත රට ශාන්තිකර්ම වල එන නාද මාලා අභාසය ඇත.
B. දකුණු ඉන්දීය කර්ණාටක සංගීතයේ අභාසය ලබා ඇත.
C. උතුරු ඉන්දීය සංගීත ආභාසය ලබා ඇත, තබ්ලාව ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වේ.

i. නාට්‍ය සම්ප්‍රදායන් තුන ඊට අයත් අක්ෂර ද සමග ලියා දක්වන්න. (ල.3)
ii. C වලට අයත් නාට්‍ය වර්ගයෙන් ගීත දෙකක් නම් කරන්න. (ල.2)
iii. D අක්ෂරය හිමි නාට්‍ය වර්ගයේ ගීතයක මුල් කොටස පද ප්‍රස්තාර කරන්න. (ල.2)
iv. උඩරට වන්නමක ඇති කොටස් නම කරන්න. (ල.5)
(මුළු ලකුණු 12)

07) පහත දී ඇති බටහිර ස්වර ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. A,B,C,D අක්ෂර වලින් පෙන්නුම් කර ඇති සංකේත නම්කරන්න. (1/2 × 4 = ල.2)
ii. ඉහත ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට අනුව ලියා දක්වන්න. (ල.6)
iii. පෙරදිග ක්‍රමයට ලියූ ප්‍රස්තාරයේ මුල් විභාග හතර මධ්‍යම භාවයට හරවා නැවත ලියන්න. (ල.2)
iv. ඉහත ගීතයට වාදනය කළ යුතු හින්දුස්ථානි තාල පදය නම් කරන්න. (ල.2)
(මුළු ලකුණු 12)

* * * * * *


(6) WWW.PastPapers.WiKi (5)
Download Term Test Papers, Short Notes From One Place!

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 40 S

## පෙරදිග සංගීතය

### ප්‍රායෝගික පරීක්ෂණය

පළමු ඇගයීම සිසුන් 12ක කණ්ඩායමක් වන සේ තෝරාගෙන ඇගයීමට ලක්කරන්න.
අනෙකුත් ඇගයීම් කේවළව ඇගයීමට ලක්කර ලකුණු පිරිනමන්න.

01) ශ්‍රවණ පරීක්ෂණය
i) ස්වර ඥාණය - ශුද්ධ ස්වර සප්තය ඇසුරෙන් " ආ" කාරයෙන් ස්වර 04 (ල.04)

ii) තාලඥාණය නිර්දේශිත තබ්ලා පදයක් තබ්ලාවෙන් වයා විමසන්න. (ල.01)
ඨේකාව අක්ෂර බෙදා දැක්වීමට ලකුණු 01

iii) රාග ඥාණය නිර්දේශිත රාගයක ප්‍රධාන ස්වර සංගතියක් ස්වර වලින් ගයා රාගය නම් කිරීමට ල.01
රාගයේ ආරෝහණ අවරෝහණ ලිවීමට (ල.02)
රාගයේ ස්වර වල විශේෂත්වය ලිවීමට (ල.01) (මුළු ලකුණු 10)

02) i) භෛරවී හෝ යමන් රාග දෙකෙන් එකක මධ්‍යලය ගීතය /වාදිතය ගායනය /වාදනය (ල.20)
ii) ඉහත තෝරා නොගත් රාගයේ සර්ගම් / ලක්ෂණ ගී ගායනය / වාදනය (ල.10)

03) i) කැමති ගැමි ගීයක් ගායනය. (ල.05)
ii) කැමති සෙ ගීයක් ගායනය ලකුණු 05

04) පහත සඳහන් ගීත අතරින් එකක් ගායනය / වාදනය කරන්න. (ල.10)
(සරල ගී, නූර්ති, නාඩගම්, නවනාට්‍ය,චිත්‍රපට,ග්‍රැමෆෝන්,කණ්ඩායම් ගී)

05) තෝරාගත් භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය කරන්න. (ල.20)

06) ස්වර පූවරුවෙන් කැමති ගීතයක් වාදනය (ල.20) (මුළු ල.100)

PAST PAPERS WIKI


Download Term Test Papers, Short Notes From One Place!

## 10 ශ්‍රේණිය පෙරදිග සංගීතය I පත්‍රය - පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01)4 | 02)2 | 03)4 | 04)1 | 05)2 | 06)1 | 07)4 | 08)1 |
| 09)2 | 10)4 | 11)1 | 12)3 | 13)2 | 14)3 | 15)2 | 16)3 |
| 17)4 | 18)3 | 19)2 | 20)1 | 21)4 | 22)3 | 23)1 | 24)4 |
| 25)3 | 26)2 | 27)1 | 28)3 | 29)4 | 30)3 | 31)3 | 32)1 |
| 33)2 | 34)2 | 35)1 | 36)1 | 37)4 | 38)3 | 39)1 | 40)4 |

## 11 ශ්‍රේණිය පෙරදිග සංගීතය II පත්‍රය - පිළිතුරු

01) i. භෛරවි ii. යමන් iii. සර්ගම් iv. මුඛාංගය v. E. Learning
vi. M1D1 vii. Youtube viii. Counter Part (point) (1×8 = ලකුණු 08)
ix. Chorus, Verse x. Introduction, Interlude (IX,X × 2 = ලකුණු 04)

02) i. A බිලාවල් රාගය B භෛරවි රාගය C භූපාලි D යමන් (ලකුණු 04යි)
ii. B හෝ D වලින් එකකට අයත් ස්වර ප්‍රස්තාරයේ ස්ථායි සඳහා ලකුණු 6යි (රාගය නම් කළ යුතුයි.)
iii. a. භෛරවි b. යමන් c භූපාලි d බිලාවල් (ල.2) (මු.ලකුණු 12)

03) i. A ජප් B දීප්චන්දි C - ත්‍රිතාලය d - දදරා (ල.2)
ii. 5/4, 4/4 (ල.2)
iii. දීප්චන්දි තාල පදය නිවැරදි ව ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු 04යි.
iv. දාදරා තාලය ලකුණු 02යි. මැදුම් තනිතිත ලකුණු 02යි. (මුළු ලකුණු 12යි)

04) (i) දී ඇති සංගීතඥයෙකු පිළිබඳව සංගීත ක්ෂේත්‍රයට සිදුකල සේවය උදාහරණ සහිතව ලියා ඇත්නම් ලකුණු 6යි.
ii) මූලික යුග තුන නම් කිරීමට ලකුණු 03යි.
iii) ගීතයේ මුල් කොටසකට අයත් ගී පාදය ලියා ඇත්නම් ලකුණු 03 (මුළු ලකුණු 12)

05) i. A සේශී B සේශී C ගැමි ගී D සේ ගී E ගැමි ගී F ගැමි ගී (1/2 × 6 = 3)
ii. A අවග්‍රහය B සමග්‍රහය (ලකුණු 02)
iii. ගී පද ප්‍රස්තාරයට ලකුණු 2 × 2 = 4යි.
iv. සාධක තුන නම් කිරීමට ලකුණු 3යි. (මුළු ලකුණු 12යි.)

06) i. a. කෝළම් b. නාඩගම් C. නූර්ති (ලකුණු 03)

ii. නූර්ති වලට අයත් ගීත දෙකක් නම් කර ඇතිනම් ලකුණු 01යි.
iii. කෝළම් ගීතයේ මුල් කොටස පද ප්‍රස්තාර කිරීමට (ලකුණු 03)
iv. උඩරට වන්නමේ කොටස් පහ සඳහා ලකුණු 05යි. (මුළු ලකුණු 12)

07) i. A. Treble clef
B. Key Signature
C. Time Signature
D. Semibreve (ලකුණු 2)

ii) | පධපම | ගරිසනි | නි ස ගම | ග ම ප ධ පම ප | රිමගරි | ස --- | (ලකුණු 6)
iii) මධ්‍යම සප්තකයට හරවා ලිවීමට ලකුණු 02යි.
| ස රි සනි | ධ ප මග | ග ම ධ නි | ධ නි ස රි ස නි ස | (ලකුණු 2)

iv) කහෙරවා / ත්‍රිතාල් (ල.2) (මුළු ලකුණු 12)



(1) www.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ඉතිහාසය
2013 - 2022
සංගීතය
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න